# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1859/65 - 2014 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2014.04.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්ජී/2211.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, ගාල්ල ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා ධර්මරාජ මාවතේ ජල ටැංකිය පිහිටි ඉඩම අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1029.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල-කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩවලමුල්ල - උතුර ග්‍රාම නිලධාරී වසමේ කුඹල්වැල්ල ගමේ පිහිටි ගල්ගොඩහේන නොහොත් පෝයගලකන්ද ශ්‍රී ධර්මරාජ මහ විහාර ඉඩම නැමති ඉඩම් කොටස පෙන්නුම් කෙරෙන බයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. අඹවත්ත මහතා විසින් පිළියෙල කර ඇති අංක 1499 දරන පිඹුරේ කැබලි අක්ෂර A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 08ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පෝයගලකන්ද ශ්‍රී ධර්මරාජ මහා විහාර ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ශ්‍රී ධර්මරාජ මාවත ; |
| *දකුණට* | : | පෝයගලකන්ද ශ්‍රී ධර්මරාජ මහා විහාර ඉඩම ; |
| *බටහිරට* | : | පෝයගලකන්ද ශ්‍රී ධර්මරාජ මහා විහාර ඉඩම. |

1A - G 19472— 78 (2014/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය :* 01. විහාරාධිපති,
ශ්‍රී ධර්මරාජ මහා විහාරය,
ශ්‍රී ධර්මරාජ මාවත,
වක්වැල්ල පාර, ගාල්ල

02. පියසේන ගුණරත්න මයා,
අංක 06,
ශ්‍රී ධර්මරාජ මාවත,
වක්වැල්ල පාර, ගාල්ල

05-330

---

එල්ඒ/2221.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට දොළුව ජල සම්පාදන ක්‍රමය යටතේ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1025.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොළුව ග්‍රාම නිලධාරී වසමේ මැදපිටිය ගමේ පිහිටි ඔරුවකෙටු තැන්න හේන වත්ත නැමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 0යි, රූඩ් 3යි, පර්චස් 18.4ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත හා කොක්කා ඔය ; |
| *නැගෙනහිරට* | : | කොක්කා ඔය සහ එච්. ඒ. එස්. සමරසිංහ මහතා හිමිකම් කියන වැල්ලගොල්ල වත්ත ; |
| *දකුණට* | : | දොළුව සිට ගුරුකැලේ දක්වා දිවෙන මාර්ගය (ප්‍රාදේශීය සභා) ; |
| *බටහිරට* | : | දොළුව සිට ගුරුකැලේ දක්වා දිවෙන මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :* 01. පී. ආර්. සීලවතී මිය,
අම්බැක්කේ ගෙදර,
මැදපිටිය,
දොළුව.

02. චන්දිමා කුමාරි ලියන්දෙණිය මෙනවිය,
අම්බැක්කේ ගෙදර,
මැදපිටිය,
දොළුව.

05-331

එල්ජී/2236.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ දූනුවිල සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1035.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දූනුවිල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දූනුවිල ගමේ පිහිටි "පිහිල්ලේ ඇලේ හේන" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 27.4ක් පමණ වන ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | දූනුවිල හන්දියේ සිට මැදවත්ත දක්වා යන මාර්ගය හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | දූනුවිල හන්දියේ සිට මැදවත්ත දක්වා යන මාර්ගය ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. කේ. ඩී. එම්. වික්‍රමසිංහ බණ්ඩා මහතා,
අංක 1/277,
දූනුවිල,
අකුරණ.

05-332

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගිරාකඩුව සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1036.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 632, මන්දන්ඩාවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පරනගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එච්. එම්. ටී. ආර්. විජේරත්න මහතා විසින් මැන සකස් කරන ලද අංක 2645 දරන බලයලත් මිනින්දෝරු සලැස්මේ කැබලි අංක 2හි කොටසක් ලෙස දැක්වෙන මුළු ප්‍රමාණයෙන් පර්චස් 25ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි "බෝගහමුදුනේ වත්ත හෙවත් නයිදාගේ හේන හෙවත් ජම්බුගොල්ලේ වත්ත " නමැති ඉඩම් කොටස ඃ

ඉඩමේ නම : බෝගහමුදුනේ වත්ත හෙවත් නයිදාගේ හේන හෙවත් ජම්බුගොල්ලේ වත්ත.
ප්‍රමාණය : පර්චස් 25
මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගිරාකඩුව - දඹගහමුදුන හරහා ජම්බුගහපිටිය මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | අංක 4936 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ඃ* 01. ආර්. එම්. ප්‍රනීත් ප්‍රියංක මහතා,
අංක 33,
දඹගහමුදුන,
ජම්බුගහපිටිය.

05-333